# හරිත නගරය

සිසිලස රැඳුණු තුරු යට විටකදී සිටින
කිසිවිට වෙහෙස ගත නැත සනසයි නයන
රිසිලෙස හමන නල රොන මුසු ගත නැකෙන
නිසිවෙන කොතැන රුදෙන මිස වන ගහන

පවසට දියද දී කුස පිනවන අහර
දවසම ළයෙහි වා පුරවන එක පැහැර
නිවසට අවැසි දෑ සැම දෙන අත් නොහැර
අවසන රුහිරු වේ තුරු වැල තුළ නහර

පුරයක සුවය ලබනට සහ සුදු සුසුම
කරනෙක වනස වන ගණ බිඳ නැත ලැබුම
සැරසෙයි පුරය කළ විට පරිසර රැකුම
නිරතුරු සැපත එනිසයි ගම සැම තැනම

නුඹගැබ සිඹින මන්දිර ගොඩ නගන විට
තැබිවිය යුතුය එය නිරතුරු ගසක යට
නිබඳව සෙවන සිසිලස දිය ලැබ පුරට
සැබවින් හරිත නගරය ගොඩ නැගෙයි සෙට

කුසුමක සුවඳ ගෙන නළ දස අත හමන
පසුකර වනය පුර මැද දුම්රිය ඇදෙන
මුසුනොවූ කිසිත් අප දෑ දිය බොන නහන
දසුනැති පුරෙහි වැසි වෙති සුරපුර වසන

දරදිය සෙවන සිසිලස වැසිදිය පවන
සරසන මලින් වායුව දී දිවි රකින
පුරවා කුස ද නගරය පියකරු කරන
කරදෙනු සුදුසු පරිසරයට පළමු තැන

නගරය සමග පරිසරය ද රැකිය යුතු
මගපුර රැකෙන්නට එය වේ කලෙක මතු
බගහර අගන පුර ගෙලලනු පිණිස මුතු
අගඑහි රඳණු යුතු පරිසර කැටය රතු

කේ.ඒ. සාරංග ඉඳුනිල්,
13 ශ්‍රේණිය,
එන්සෙෆ් බෞද්ධ විද්‍යාලය,
නව නගරය,
මුල්ලේරියාව.

( 2005 ලෝක පරිසර දිනය නිමිත්තෙන් පවත්වනු ලැබූ පද්‍ය නිර්මාණ තරඟාවලියේ ජ්‍යෙෂ්ඨ අංශයේ පළමු ස්ථානය )